**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ඒකකය (PI&MU)**

## ධීවර වරායන් හා නැංගුරම්පොලවල් ඉදිකිරීම / වැඩිදියුණු කිරීම

# ඉංජිනේරුවන් සඳහා ඇබෑර්තු

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද, ධීවර වරාය හා නැංගුරම්පොලවල් ඉදිකිරීම / වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ඒකකය විසින් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) - ඇබෑර්තු - 01

රැකියා විස්තරය

ව්‍යාපෘතියට අදාළ සියලුම කොන්ත්‍රාත්තුමය කරුණු පිළිබඳව කටයුතු කිරීම, සියලුම පැකේජවල ඉදිකිරීම් කාර්යයන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා මතුව ඇති ගැටලු විසඳීම සඳහා උපදේශකයින් හා කොන්ත්‍රාත්කරුවන් අතර සම්බන්ධීකරණය කිරීම, වැඩබිම් කටයුතු අධීක්ෂණය කොට තත්ත්වය පාලනය සඳහා කටයුතු කිරීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් සහතික කිරීම.

සුදුසුකම් හා පළපුරුද්ද

1. පිළිගත් වෘත්තීය ආයතනයක වරලත් / ආයතනික සාමාජිකත්වය

හෝ

2. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සහ අදාළ (සිවිල් / වෙරළාශ්‍රිත ඉංජිනේරු) ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

වැටුප

ඉංජිනේරුවරයෙකුගේ මූලික වැටුප පියවර (අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ පී4) රුපියල් 100,000/-+ රජයේ අනුමත දීමනා (මූලික වැටුප් පියවර - රුපියල් 100,000.00 සහ රුපියල් 115,000.00 දක්වා සුදුසුකම් හා රැකියාවලට අදාළ පළපුරුද්ද මත සාකච්ඡා කළ හැක)

## වෙරළාශ්‍රිත කටයුතු ඉංජිනේරු - (ඇබෑර්තු - 01)

රැකියා විස්තරය

වෙරළබඩ සියලුම ප්‍රතිසංස්කරණ කටයුතු පරිපාලන හා වෙරළ තීරය ආරක්ෂා කිරීමට සැලසුම් සංවර්ධනය කිරීම, සියලු වෙරළබඩ උපද්‍රව විශ්ලේෂණය කිරීම හා ජල ගැලීම් සැලසුම් සිතියම් සකස් කිරීම, ව්‍යාපෘති විශ්ලේෂණය හා වෙරළබඩ ව්‍යාපෘතිවල අයවැය හා වැඩසටහන් සංවර්ධන කිරීම, අවශ්‍ය පාරිසරික ලේඛණ හා සියලු තාක්ෂණික ලේඛණ සංවර්ධනය කොට ඇගයුම් කිරීම හා සියලු සේවාදයක රැස්වීම්වලට සහභාගී වීම, සියලු වෙරළබඩ සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිණිස ජල විද්‍යාඥයන් හා සැලසුම් ඉංජිනේරුවන් සමග සම්බන්ධීකරණය කිරීම, සියලු වෙරළබඩ අපද්‍රව්‍යයන් විශේල්ෂණය කිරීම හා විවිධ ක්‍රියාපටිපාටින් උදෙසා සියලු දුවගතිවිද්‍යා ආදර්ශ සැකසීම හා සියලු ව්‍යාපෘති සැලසුම් සඳහා සහභාගිවීම හා ඵලදායී ව්‍යාපෘති වැඩසටහන් සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම

සියලු වෙරළබඩ වෙරළතීර ප්‍රතිසංස්කරණ කටයුතු අධීක්ෂණය කිරීම හා සියලු සංසිද්ධීමේ ක්‍රියාවලින් විසැඳීම සඳහා සහයෝගය දක්වීම මෙන්ම වෙරළබඩ ප්‍රදේශයේ සියලු හදිසි ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දක්වීමද අයත් වේ.

සුදුසුකම් හා පළපුරුද්ද

1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වීම

සහ

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

හෝ

2. රජයේ දීමනා ව්‍යාප්ත සේවයේ (ඉංජිනේරු සේවා) III/II පංතියේ හෝ ඉහළ නිලධාරියෙකු වීම හෝ අදාල ක්ෂේත්‍රයේ සමාන තනතුරක්

සමග

II/III පංතියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද

වැටුප

ඉංජිනේරුවරයෙකුගේ මූලික වැටුප් පියවර (අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය - පී 4) රුපියල් 100,000.00+රජයේ අනුමත දීමනා (මූලික වැටුප් පියවර - රුපියල් 100,000.00 සහ රුපියල් 115,000.00 දක්වා රැකියාවට අදාළව සුදුසුකම් හා පළපුරුද්ද මත සාකච්ඡා කළ හැක)

**සියලුම තනතුරු සඳහා කොන්දේසි**

**බඳවා ගැනීම : කොන්ත්‍රාත් පදනමින් වේ.**

තමන් විසින් පිළියෙල කරගත්, ජීව දත්ත සහිත අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, ව්‍යාපෘති අධ්‍යක්ෂ, ධීවර වරාය හා නැංගුරම්පොලවල් ඉදිකිරීම / වැඩි දියුණු කිරීම, 01 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය . අදාළ කවරයේ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

නැතහොත් Kapilajb@gmail.com වෙත 2016.10.15 වන දිනට පෙර යොමු කරන්න.
වැඩිදුර විස්තර සඳහා, කපිල ජනක බණ්ඩාර (නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - පරිපාලන හා සංවර්ධන) මහතා වෙත කාර්යාල වේලාවන් තුළදී
දුරකථන අංක +94773410575 හෝ + 94112384639 මගින් යොමුවන්න.

**ඩබ්ලිව්. එම්. එම්. ආර්. අධිකාරි**
**ලේකම්,**
**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**